ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය සංවර්ධනය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා වැඩ සටහන -3 වන මට්ටම

අවසාන පරීක්ෂණය 2017/2018

**EPD3530/ESD1230- ළමා සංවර්ධනය I**

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2019.02.23 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට ද (03) පමණක් පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. රූසෝ (Rousseau) ළමා සංවර්ධනයේ අවස්ථා පහක් (05) පෙන්වා දී ඇත. එම අවස්ථා පහ (05) නම් කරන්න.

02. පියාජේ ඉදිරිපත් කළ ප්‍රජානන සංවර්ධනය න්‍යායට අනුව අනුවර්තන ක්‍රියාවලිය සිදුවන ආකාරය පැහැදිලි කරන්න.

03. දෙමව්පියන් ළමයින් හදා වඩා ගැනීමේ දී අනුගමනය කරන ශෛලින් තුන (03) සහ ඒවායේ ප්‍රධාන ලක්ෂණ සඳහන් කරන්න.

04. පරිනතිය හා ඉගෙනුම අතර සම්බන්ධතාව සුදුසු උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න.

05. "අන්තඃපුද්ගල බුද්ධිය" හෙවත් "පුද්ගල ඇතුළාන්ත බුද්ධිය" පැහැදිලි කරන්න.

06. (i) "අවිදූර සංවර්ධන කලාපය" යන සංකල්පය ඉදිරිපත් කළ අධ්‍යාපනඥයා නම් කරන්න.

    (ii) "අවිදූර සංවර්ධන කලාපය" යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

07. ළමයින් තුළ "ස්වසංකල්පය" සංවර්ධනයෙහි ලා බලපෑ හැකි සාධක දෙකක් (02) නම් කර එම එක් සාධකයක් පැහැදිලි කරන්න.

08. (i) "ස්මෘතිය" යනු කුමක්දැයි ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.

    (ii) "ඉන්ද්‍රිමය ස්මෘතිය" යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 x 8 = 40)

## දෙවන කොටස

09. (i) අවධානයේ ආකාර පහක් **(05)** නම් කරන්න. (ලකුණු 05)

(ii) නම් කරන ලද එක් අවධාන ආකාරයක් උදාහරණ සපයමින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) සිසුන්ගේ අවධානයෙන් යුතුව කටයුතු කිරීමේ කුසලතාව දියුණු කිරීම සඳහා ප්‍රාථමික පාසල් ගුරුවරයෙකුට කළ හැකි ක්‍රියාකාරකම් දෙකක් **(02)** පැහැදිලි කරන්න. (ලකුණු 08)

10. (i) "චර්යාවාදී න්‍යාය" අනුව භාෂා සංවර්ධනය සිදුවන ආකාරය විස්තර කර ඇති අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ප්‍රාථමික ශ්‍රේණිවල ඉගෙන ගන්නා සිසුන්ට භාෂාව ඉගැන්වීමේදී එම අදහස් ප්‍රයෝජනයට ගත හැකි ආකාර උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු10 )

11. (i) හොවාර්ඩ් ගාඩ්නර්ගේ "බහුවිධ බුද්ධි න්‍යාය" අනුව බුද්ධිය විස්තර කර ඇති ආකාරය පැහැදිලි කරන්න. **(ලකුණු 10)**

(ii) ප්‍රාථමික පාසල් සිසුන්ගේ ඉගෙනුම සංවර්ධනය කිරීමේදී එම අදහස් ප්‍රයෝජනවත් වන ආකාර උදාහරණ සමගින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i) පියාජේ ඉදිරිපත් කළ ප්‍රජානන සංවර්ධන න්‍යායට අනුව ළමයින්ගේ චින්තන සංවර්ධනයේ අවධි හතර (04) නම් කරන්න. (ලකුණු 10)

සංයුක්ත ක්‍රියාකාරී චින්තන අවධියේ (වයස අවුරුදු 7-11) සිසුන්ගේ චින්තනයේ ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. (i) බූම්රන්ඩ් (Baumrind) විසින් ඉදිරිපත් කරන ලද ළමයින් හදා වඩා ගැනීමේ ශෛලීන් තුන **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ළමයින් හදා වඩා ගැනීමේ ක්‍රම අනුව ළමයින්ගේ හැසිරීම තීරණය වන ආකාරය උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.